*සැ. යු.*- 2024.03.01 දින පළකරන ලද අංක 2374 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,375 - 2024 මාර්තු මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2024.03.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 54 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 58 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 මාර්තු 28 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 මාර්තු මස 15 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

53 - B 082547 — 353 (2024/03)
D 1 -

# පිස්කල් විකිණීම්

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ දිසා අධිකරණයේ දී ය

01. දසනායක මුදියන්සේලාගේ ලූවිනෝනා (මියගොස්)

01. (A) අමරසිංහ මුදලිගේ ශ්‍රීමතී අමරසිංහ,
(B) අමරසිංහ මුදලිගේ ශ්‍රීමතී අමරසිංහ

නඩු අංකය : 14999/P

*දෙදෙනාම :* අංක 272/3, සුදර්ශන මාවත, මාලබේ.

*.............පැමිණිලිකරුවෝ.*

*එදිරිව*

01. ඒ. එම්. හෙන්රි එඩ්වඩ් (මියගොස්)
අංක 84/1, ඒ. පී. හින්නිඅප්පුහාමි මාවත, කොළඹ 13.
01. අ. ඒ. එම්. ක්ලැරන්ස් ජානක (මියගොස්)
අංක 82, ඒ. පී. හින්නි අප්පුහාමි මාවත, කොළඹ 13.
01. (A) අමරසිංහ මුදලිගේ ට්‍රික්සි ජානකි,
අංක 271/50, රෙස්ටා ගාර්ඩන්, කෙරවලපිටිය, හැඳල, වත්තල.

02. ලියනගේ ප්‍රින්සි
අංක 287, කොතලාවල, කඩුවෙල,

*දූන්*

අංක 261/4/3, විමුක්ති මාවත, පිට්ටුගල, මාලබේ.

03. ලියනගේ ජොයිස්

අංක 84/1, ඒ. පී. හින්නිඅප්පුහාමි මාවත, කොළඹ 13.

*දූන්*

අංක 163/61, විමුක්ති මාවත, පිට්ටුගල, මාලබේ.

04. හේවගේ ඇලෙක්සැන්ඩර් පෙරේරා (මියගොස්),
අංක 85, ඒ. පී. හින්නිඅප්පුහාමි මාවත, කොළඹ 13,

04. (අ) හේවගේ මහේෂ් නලින් පෙරේරා,
අංක 84/1, ඒ. ජී. හින්නිඅප්පුහාමි මාවත, කොළඹ 13.

05. හේවගේ මාග්‍රට් පෙරේරා (මියගොස්),
අංක 85, ඒ. ජී. හින්නිඅප්පුහාමි මාවත, කොළඹ 13,
05. (අ) ඒ. එම්. ක්ලැරන්ස් ජානක (මියගොස්),
අංක 82, ඒ. ජී. හින්නිඅප්පුහාමි මාවත, කොළඹ 13.
05. (A) ජයලත් යක්කල මුල්ලගේ ඉනිඩ් ජසින්තා ද සිල්වා
අංක 271/52, රෙස්ටා ගාර්ඩන්, කෙරවලපිටිය පාර, හැඳල, වත්තල.

06. හේවගේ සිරිල් පෙරේරා,
අංක 268/1, දළුපිටිය, කඩවත.

07. හේවගේ ඇලෝෂියස් පෙරේරා (මියගොස්),

07. (A) මුල්ලකන්ද ආරච්චිගේ මේරි බ්‍රිජට්,
W 1, දවටගහවත්ත, ගොංගිතොට, වත්තල

08. හේවගේ ජොෂප් පෙරේරා (මිය ගොස්),
අංක 01, දවටගහවත්ත, ගොන්ගිතොට, වත්තල.

08 (අ) වික්‍රමසිංහ මුදියන්සේලාගේ බ්‍රිජට්,
අංක 01, දවටගහවත්ත, ගොන්ගිතොට, වත්තල.

08 (A) හේවගේ බුද්ධික ප්‍රසාද් පෙරේරා, අංක 55, පාසල පිටුපස, ගොංගිතොට, එඬෙරමුල්ල, වත්තල.

09. එස්. ඒ. නාගරාජා,
අංක 84, ඒ. පී. හින්නිඅප්පුහාමි මාවත, කොළඹ 13.

10. රනිරේසන් නඩරාජා,
අංක 84, ඒ. ඒ. පී. හින්නිඅප්පුහාමි මාවත, කොළඹ 13.

*...................විත්තිකරුවෝ.*

ඉහත අංක දරන නඩුවට අදාළ ඉඩමට හා ස්ථානයට ඉහත නම් සඳහන් පැමිණිලිකරුවන්ට හා විත්තිකරුවන්ට එකී නඩුවේ වාර්තාගත කර ඇති 2003.09.03 දිනැති තීන්දුව ප්‍රකාරව එහි ලා දැක්වෙන කොටස් අනුව හිමිකම් ලබන බවට ද, එකී තීන්දු ප්‍රකාශයේ වඩාත් සම්පූර්ණ ලෙස විස්තර සහිත එකී ඉඩම හා ස්ථානයේ බෙදුම් නඩු පනතේ 27 වගන්තිය ප්‍රකාරව විකුණා ලැබෙන මුදල නඩුවේ බැරට ගෙනා යුතු බවටත් ආඥා කර ඇති හෙයින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති ඉඩම හා ස්ථානය ගරු අධිකරණය මගින් අනුමත කර ඇති විකිණීමේ කොන්දේසිවලට යටත් ව, එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරි පත්‍රයේ බලය පිට වර්ෂ **2024 ක් වූ අප්‍රේල් මස 02 වැනි දින පෙරවරු 11.00 ට** එකී දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**ඉහත කී පැමිණිල්ලේ සඳහන් උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නාගරික බල සීමාව තුළ එච්. ඩී. ඩයස් ප්‍රසිද්ධ මිනින්දෝරු තැන විසින් 1916.05.17 වන දින මැන සාදන ලද අංක 1822 දරන පිඹුර ප්‍රකාර නිව් චෙට්ටි වීදියේ වරිපනම් අංක 67, 68 දරන දේපලින් (පර්චස් 09.25) ක් විශාල සී කොටසට මායිම් උතුරට : වැන්රොයන් පාරට වෙන් කළ කොටස ද, නැගෙනහිරට : එච්. පෙරේරාගේ අංක 9 ඒ දරන ඉඩම (දැන් වැන්රොයන් පාර) ද, දකුණට : ජේ. ගුණමුත්තුගේ අංක 69 දරන ඉඩම ද, බස්නාහිරට : මරිය පෙරේරාගේ ඉඩම.

**ඉහත කී ඉඩම මූලික පිඹුරේ සඳහන් උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නාගරික බල සීමාව තුළ ඇන්. ඩී. ජේ. වී. පෙරේරා බලයලත් මිනින්දෝරු තැන විසින් 1991.07.28 වන දින මැන සාදන ලද අංක 12159 දරන පිඹුර ප්‍රකාර ඒ. ජී. හින්නි අප්පුහාමි මාවතේ පිහිටි වරිපනම් අංක 82, 82 ඒ. 82 බී, 84 සහ 86 දරන පර්චස් 09.60 ක් විශාල ඉඩමට මායිම් උතුරට : ඒ. ජී. හින්නිඅප්පුහාමි මාවත ද, නැගෙනහිරට : එච්. පෙරේරාගේ අංක 9 ඒ දරන ඉඩම (දැන් වැන්රොයන් පාර)ද, දකුණට : ජේ. ගුණමුත්තුගේ අංක 69 දරන ඉඩම ද, බස්නාහිරට : මරිය පෙරේරාගේ ඉඩම.

*දේපළ වෙත පිවිසීම.*- කොළඹ දිසා අධිකරණය ළඟ සිට වතුර ටැංකිය පාරේ කිලෝමීටර 1 ක් පමණ ගිය විට ඒ. පී. හින්නිඅප්පුහාමි මාවතේ වම් පස මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*-වෙන්දේසිය අවසන් වූ විගස ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

01. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25% ක් මිල දී ගත් වහාම ගෙවිය යුතුය.
02. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය යටතේ අය කිරීම් ද,

03. පළාත් පාලන ගාස්තු වශයෙන් 1%
04. ඉතිරි 75% ක මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත දී කොළඹ දිසා අධිකරණයේ නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.
05. සියලුම වියදම් ගැණුම්කරු විසින් වෙන්දේසි අවසන් වූ විගසම ගෙවිය යුතුය.

අධිකරණයේ අණ පරිදි,

එන්. වී. එස්. ලක්මාලි,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය, කොළඹ.

වර්ෂ 2024 ක් වූ පෙබරවාරි මස 22 වැනි දින,
කොළඹ දිසා අධිකරණයේ දී ය.

03-143

---

## කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

2014 ජනවාරි මස 27 වන දින සකස් කොට ඇතුළත් කරන ලද බේරුම් කරන තීන්දුවක් බලාත්මක කරවා ගැනීම සඳහා 1995 අංක 11 දරන බේරුම් කරන ආඥාපනතේ 31 වන වගන්තිය යටතේ හා අනුව කරනු ලබන ඉල්ලීම හා සම්බන්ධ කාරණාවේ දී ය.

නඩු අංකය : CHC/162/2014/ARB
වටිනාකම : රු. 12,517,134.83

ෆස්ලි අහමඩ් අසාර්,
අංක 6, රුදිගු පටුමග,
දෙහිවල.

......................පෙත්සම්කරු.

*එදිරිව*

ටී මාස්ටර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 115,
ජාවත්ත පාර, කොළඹ 05,

*සහ තව ද,*

අංක 18, තිස්ස මාවත, බොරුපන පාර, රත්මලාන,

*නව ලිපිනය :*

අංක 16, තිස්ස මාවත, බොරුපන පාර, රත්මලාන.

...................වගඋත්තරකරු.

වර්ෂ 2016 ක් වූ අප්‍රේල් මස 26 වන දින බස්නාහිර පළාත්බද කොළඹ දී පැවැත්වෙන සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන මහාධිකරණයේ නඩු තීන්දුව අනුව එකී පෙත්සම්කරු විසින් වගඋත්තරකරුවන්ගෙන් අයකර ගැනීමට නියමිත එනම් පෙත්සමේ සාක්ෂි මගින් D වශයෙන් ලකුණු කර ඇති වර්ෂ 2014 ක් වූ ජනවාරි මස 27 වන දින දරන බේරුම්කාර ප්‍රදානය අනුව,

(අ) වගඋත්තරකරුට ණය දෙන ලද මුදල්වලින් යන්ත්‍රය විකිණීමෙන් ලත් රුපියල් මිලියන 5ක මුදල අඩු කිරීමෙන් පසුව ඔහුට අයවිය යුතුව ඇති ශේෂය වන රු. 9.623,519.33 ක මුදලක් ද,

(ආ) යන්ත්‍රය විකිණීමේ දිනය දක්වා දරන ලද ප්‍රමාද ගෙවීමේ ගාස්තුව වන රු. 1,588,464.02 ක මුදලක් ද,

(ඈ) ගෙවීමට ඇති ශේෂ මුදල පූර්ණ හා අවසාන වශයෙන් ගෙවා නිම කරන දින දක්වා 2011 අප්‍රේල් මස 08 වැනි දින සිට මසකට 1.5% බැගින් වූ අනුපාතය අනුව එකී ගෙවීමට ඇති ශේෂ මුදල මත දිගටම උපචිත වෙමින් පවතින ප්‍රමාද ගෙවීම් ගාස්තු ද,

(ඇ) බේරුම්කරණය ඉදිරියේ දී ප්‍රමාණවත් සාක්ෂි ගෙනහැර දක්වා නොතිබූ බැවින් හිමිකම් ප්‍රකාශයේ (ඈ) ආයාචනයේ දක්වා ඇති දරන වියදම් වශයෙන් යාචනය කොට ඇති රු. 425,017.00 ක මුදල් ප්‍රමාණය ප්‍රදානය නොකරන බව ද,

(ඉ) හිමිකම්පාන්නාගේ සංශෝධිත වියදම් වාර්තාව පෙන්නුම් කෙරෙන පරිදි වූ රු. 1,305,151.48 ක බේරුම්කරණ වියපැහැදම් පිරිවැය ද,

වර්ෂ 2016 ක් වූ අප්‍රේල් මස 26 වන දින බස්නාහිර පළාත්බද කොළඹ දී පැවැත්වෙන සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන මහාධිකරණයේ නඩු තීන්දුව ඉටුකිරීමට වගඋත්තරකරු අපොහොසත් වී ඇති බැවින් වානිජ මහාධිකරණ රෙජිස්ට්‍රාර් විසින් 2017.01.25 වන දින තහනම් කරන ලද වගඋත්තරකරුට අයත් පහත ලේඛනවල සඳහන්කර ඇති එම දේපල පිහිටි ස්ථානවල දී.

**වර්ෂ 2024 ක් වූ අප්‍රේල් මස 01 වැනි දින පෙ.ව. 10.00 ට,**

දේපළ පිහිටි ස්ථානයේ මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, තෙළවල ගමෙහි පිහිටි ලේඩි කැතරින් ගෘෘප් නමැති ඉඩම 1956.06.15 වැනි දින අංක 111 දරන ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට : ලොට් (69B 111) ප්ලෑන) නැගෙනහිරට ලොට් 74(වෙන් කරන ලද පාර) දකුණට ලොට් 89 (වෙන් කරන ලද පාර) ද, සහ බස්නාහිරට ලොට් 76 න්ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් විසිදෙකයි දශම පහයි බිංදුව (පර්. 22.50) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග වන මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කොට්ඨාසය එම්. වෙළුම්/පත්ඉරු 2460/167 යටතේ ලියාපදිංචි කර ඇත. ග්‍රාම නිලධාරි වසම බොරුපන අංක 549/A.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, තෙළවල ගමෙහි පිහිටි ලේඩි කැතරින් ගෘෘප්හි 1956/06/15 වැනි දින අංක 111 දරන පිඹුරේ ලොට් 69 B ඉඩමට මායිම් වශයෙන් : උතුරට : ලොට් 69/A (පිඹුරු අංක 111 ද) නැගෙනහිරට : ලොට් 74 පිඹුරු අංක 111 (පාර ද), දකුණට : ලොට් 75 111 ප්ලෑන ද, බස්නාහිරට : ලොට් 68 111 ප්ලෑනෙන් ද මායිම වූ පිඹුර ප්‍රකාරව පර්චස් විස්සක (පර්. 20) විශාලත්වයෙන් වූ ඉඩම සමග වන මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කොට්ඨාශය M වෙළුම/පත්ඉරු 2168/24 යටතේ ලියාපදිංචි කර ඇත. ග්‍රාම නිලධාරි වසම බොරුපන අංක 549/A.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව නගර සභා සීමාව තුළ තෙළවල හි පිහිටි ලේඩි කැතරින් ගෘෘප් නමැති ඉඩම බලයලත් මිනින්දෝරු පී. ප්‍රනාන්දු විසින් 1979/05/04 වන දින පිළියෙල කරන ලද අංක 521 දරන පිඹුරේ ලොට් 89 දරන ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට : ලොට් 75 නැගෙනහිරට ලොට් 74 දකුණට ලොට් 94/A බස්නාහිරට ලොට් 88 න්ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් විසිදෙකයි දශම පහයි බිංදුව (පර්. 22.50) විශාලත්වයෙන් වූ ඉඩම සමග වන මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කොට්ඨාසයේ E වෙළුම/පත්ඉරු 21/102 යටතේ ලියාපදිංචි කර ඇත. ග්‍රාම නිලධාරි වසම බොරුපන අංක 549/A

*ඉඩමට පිවිසීම*.- රත්මලාන ගොලු මඩම හන්දියේ සිට බොරුපන පාරේ කිලෝමීටර් 1 පමණ ගියවිට දකුණ පසින් තිස්ස මාවත හමුවේ. එම පාරේ මීටර් 50 ක් පමණ ගියවිට දකුණු පසින් අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ.

1. වෙන්දේසිය අවසන් කළ වහාම ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25% ක් මුදලින් ගෙවිය යුතුයි.
2. රජයේ ගාස්තු හා අනෙකුත් ගාස්තු.
3. ඉතිරි 75% දින තිහක් ඇතුළත කොළඹ වාණිජ මහාධිකරණයේ තැන්පත් කළ යුතුයි.
4. සී.න. වි. සංග්‍රහයේ 258 යටතේ පිස්කල් ගාස්තු ද ගෙවිය යුතුයි.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
වානිජ මහාධිකරණය,
කොළඹ 12.

03-204

# විවිධ දැන්වීම්

**සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වන බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී ය**

කොළඹ 02, හුණුපිටිය හරස් පාර, අංක 2 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති නෝර්ත් සෙවන් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් පිළිබඳ කාරණයේ දී ය.

නඩු අංකය : CHC/02/2024/CO
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම.

*සහ*

2007 අංක 07 දරන සමාගම් පනතේ 270(ඉ) සහ/හෝ (ඊ) වගන්ති යටතේ කරනු ලබන නෝර්ත් සෙවන් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් අධිකරණය මගින් ගණන් බේරා වසා දැමීම සඳහා කරනු ලබන ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී ය.

නෝර්ත් සෙවන් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 2, හුණුපිටිය, හරස් පාර, කොළඹ 02.

*......................පෙත්සම්කරු.*

කොළඹ දී පැවැත්වෙන සහ සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාත්බද මහාධිකරණය මගින් ඉහත නම් සඳහන් පෙත්සම්කාර සමාගම වන නෝර්ත් සෙවන් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම ඇවර කිරීම සඳහා වන පෙත්සමක් ඉහත නම් සඳහන් පෙත්සම්කරු විසින් 2024 ජනවාරි මස 12 වන දින එකී අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ. එකී පෙත්සම් 2024 අප්‍රේල් මස 03 වන දින විමසීමට ගැනීමට නියම කොට ඇති අතර එකී සමාගමේ යම් ණයහිමියෙකුට හෝ සහදායකයකු හෝ එකී පෙත්සම පිළිබඳ නියෝගයක් නිකුත් කිරීමෙහි ලා පක්ෂවීමට හෝ විරුද්ධ වීමට බලාපොරොත්තු වන්නේ නම් නඩුව විභාගවන අවස්ථාවේ දී පුද්ගලිකව හෝ තම නීති උපදේශක මගින් හෝ නීතිඥතැන මගින් ඒ සඳහා පෙනී සිටිය හැකි අතර පෙත්සමේ පිටපතක් අවශ්‍යවන ඕනෑම ණයහිමියෙකුට හෝ සහදායකයකුට ඒ සඳහා නිර්දේශිත ගාස්තුව ගෙවූ විට පහත අත්සන් කරන අය විසින් ලබා දෙනු ඇත.

*සටහන* .- මෙම නඩුව විමසීමට ගන්නා අවස්ථාවට පැමිණ සිටීමට බලාපොරොත්තුවන යම් අයෙක්වේ නම්, එසේ කිරීමට කැමැත්ත දක්වමින් ලිඛිත නිවේදනයක් පෙත්සම්කරුගේ ඉහත නම් සඳහන් ලේඛනගත නීතිඥවරයා වෙත තැපැල් මගින් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ යුතුය. එම නිවේදනයේ පුද්ගලයාගේ නම හා ලිපිනය, සමාගමක් නම් සමාගමේ නම සහ ලිපිනය, සඳහන් කොට පුද්ගලයා හෝ සමාගම හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ නීතිඥවරයා (සිටී නම්) විසින් අත්සන් කොට, ගෙනැවිත් භාරදීම හෝ තැපැල් මගින් එවන්නේ නම් ඉහත නම් සඳහන් අය වෙත කල්වේලා ඇතිව **2024 අප්‍රේල් මස 02 වැනි දින** සවස පහට (ප. ව. 5.00) පෙර ලැබීමට සැලැස්වීම හෝ තැපැල් කිරීම හෝ කළ යුතුය.

දිනූෂා මිරිහාන,
පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥ.

අංක 10/6/3, කන්දවත්ත, ටෙරස්, නුගේගොඩ.

03-125

## පාර්ලිමේන්තුව

### ද ගුඩ්නස් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

සෙය්යිඩ් අලි සාහීර් මවුලානා වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ '' ද ගුඩ්නස් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

(අ) විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන සිසුන් වෙනුවෙන් ශිෂ්‍යාධාර ක්‍රමයක් හා ඔවුන් රැකියා වෙළඳපලට සරිලන ආකාරයට හැඩගැන්වීමට අවශ්‍ය දේශන, වැඩමුළු පැවැත්වීම ;

(ආ) ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් විවිධ උපකාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඔවුන් වෙනුවෙන් අවශ්‍ය ආධාර උපකාර සලසා දීම ;

(ඇ) රැකියා විරහිත තරුණ තරුණියන් ස්වයං රැකියාවලට යොමු කරවා ඔවුන්ට අවශ්‍ය ආධාර, අනුබලය ද පුහුණුව ද ලබාදීම යනාදිය වේ.

සෙය්යිඩ් අලි සාහීර් මවුලානා,
පාර්ලිමේන්තු මන්ත්‍රී

03-126

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.